Elevate Textiles™

# ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය

# පටුන


**හැඳින්වීම** **3**

උල්ලංඝනය කිරීම් සඳහා දඬුවම්
ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය අනුගමනය
කළ යුත්තේ කවුරුන්ද
අවංක බව පිළිබඳ ගැටළුවලට පිළියම් යෙදීම
විමර්ශන හා විනය ක්‍රියාවලිය **4**
පුහුණුව සහ අධ්‍යාපනය
පළකිරීමේ අවශ්‍යතා

**එලවේට් ටෙක්ස්ටයිල්ස් ව්‍යාපාරය තුළ අවංකභාවය** **5**
බැඳීයා පිළිගැටුම
පුද්ගලික ව්‍යාපාරික සම්බන්ධතා
ඥාතීන් සමග ව්‍යාපාර කිරීම
පාරිතෝෂික, ත්‍යාග සහ විනෝදාස්වාදය
තරඟකාරී තොරතුරු ලබා ගැනීම
ජාත්‍යන්තර වෙළඳ නීති
විදේශීය දූෂණ ක්‍රියා පරිචය පනත **6**
සංගත විරෝධී බව සහ සාධාරණ තරඟකාරීත්වය
වෙළඳ සම්බාධක **7**
වර්ජන විරෝධීබව
ආරක්ෂාව
දේශපාලන ක්‍රියාකාරකම් සහ දායකත්වයන්
නීති හා අනුකූල වීම
ගුණාත්මකභාවය සහ පරීක්ෂා කිරීම **8**

**එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවා ස්ථානය තුළ අවංකව කටයුතු කිරීම** **8**
මිනිසුනට සාධාරණ ලෙස සැලකීම
සම අවස්ථා සේවානියුක්තිකයා
වෙනස් ආකාරයට නොසැලකීම/හිරිහැර නොකිරීම
මත්ද්‍රව්‍යවලින් තොර සේවා ස්ථානයක් **9**
මානව හිමිකම් සහ කම්කරු ක්‍රියාකාරකම්
ළමා ශ්‍රමය සහ බලෙන් ලබා ගන්නා ශ්‍රමය
වැඩ කරන වේලාව
වේතන **10**
සේවා ස්ථාන තර්ජන සහ ප්‍රචණ්ඩත්වය
සාමූහික කේවල් කිරීම

වංචනික හැසිරීම
පාරිසරික සෞඛ්‍යය සහ නිරපදා ප්‍රතිපත්ති
සෞඛ්‍යය සහ නිරපදාව
පාරිසරික ප්‍රතිපත්ති
ගෝලීය තිරසාරත්වය සම්බන්ධයෙන් අපගේ නිරන්තර කැපවීම **11**
එලවේට් ටෙක්ස්ටයිල්ස් හි සීමිත ද්‍රව්‍ය ලැයිස්තු ප්‍රතිපත්තිය

**එලවේට් ටෙක්ස්ටයිල්ස් හි තොරතුරු සහ දේපලවල අවංකභාවය** **11**
රහස්‍ය තොරතුරු
මූල්‍ය වාර්තාකරණයේ සහ වාර්තා තබා ගැනීමේ නිරවද්‍යතාව **12**
සමාගමේ සම්පත් සහ බුද්ධිමය දේපළ
රජය සමඟ වන සන්නිවේදනයන් **13**
මහජනතාව සමඟ අදහස් හුවමාරු කර ගැනීම

**ශක්තිමත් බැඳීමක්** **13**

**සේවකයාගේ තහවුරු කිරීම** **14**

# හැඳින්වීම

## ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය හඳුන්වාදීම

*නිසි ව්‍යාපාරික සදාචාරයන් සහ චර්යා ධර්ම වෙනසක් ඇති කරයි.*

සෑම දිනකම ඔබ එලවේට් ටෙක්ස්ටයිල්ස්හි සාර්ථකත්වයට වැදගත් වන තීරණවලට මුහුණ දීම සහ තීරණ ගනු ලැබීම සිදුවනු ඇත. එහෙත්, සදාචාර විරෝධී, දුරාචාරවත් සහ වෘත්තීමය නොවන ක්‍රියාකාරකම් සාධාරනීකරණය කරන ව්‍යාපාර අවශ්‍යතා එහි කිසි විටක නොතිබෙනු ඇත. අප ව්‍යාපාර කරන ආකාරය සහ අප අනෙක් අයට සලකන ආකාරය කර්මාන්තය තුළ අපේ කීර්තිනාමය සහ ගෝලීය වශයෙන් ව්‍යාපාරය ආරක්ෂා කිරීමට ඉතා වැදගත් වේ.

ලොව වටා සිටින සියළුම එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් චර්යා ධර්ම සංග්‍රහයට උපරිම ලෙස අනුකූල වන බවත් එය තේරුම් ගෙන ඇති බවටත් වග බලා ගැනීම ගෝලීය චර්යා ධර්ම සංග්‍රහයෙහි මූලික අරමුණ වේ. තවද අපේ ගනුදෙනුකරුවන්ට සියළු වෙළඳපල මගින් නිරන්තර ප්‍රමිතියත්, වටිනාකමත් සැපයෙන බවටත් එමගින් වග බලා ගත යුතුය. තවද ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය මගින් ඔබේ රැකියාව පිළිබඳ හොඳ තීරණයක් ගැනීමේදී ඔබට පහසුවෙන් ලබා ගත හැකි යහපත් පරිශීලන ග්‍රන්ථයක් සැපයෙන බවටත් අපි බලාපොරොත්තු වෙමු. මෙම ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය මගින් ඔබ මුහුණ දෙන සෑම තත්ත්වයකටම හෝ අවශ්‍යතාවකටම පිළිතුරු නොසපයන නමුත් ඔබේ වෘත්තීය සහ පුද්ගලික හැසිරීම සහ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි සෑම සේවකයකු විසින්ම අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කරන මූලික නීති සහ ක්‍රියා පිළිවෙත් සම්බන්ධයෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි මූලික අරමුණු දක්වයි. ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය ඔබේ යහපත් තීරණ සහ ව්‍යවහාරික ඥාණයෙන් යුතුව කටයුතු කිරීමේ පුද්ගලික වගකීමට ආදේශකයක් නොවිය යුතුය. මක් නිසාද යත් එවිට ඔබේ ක්‍රියාකාරකම් මගින් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි අවංකභාවය පිළිබඳ කීර්තිනාමයට හානියක් ඇති නොවන හෙයිනි. ඔබ මෙම ගෝලීය ප්‍රතිපත්ති සංග්‍රහය ඔබේ දෙපාර්තමේන්තුවේ, අනුප්‍රාප්තික ආයතනයක හෝ ව්‍යාපාරික ඒකකයක ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ වැඩ නීති සමඟ ඒකාබද්ධව භාවිතා කළ යුතුය. කෙසේ වුවත් අප සමාගම විශ්වාසය තබන්නේ නිවැරදි දෙය තෝරා ගැනීමට සඳහා වූ ඔබේ පුද්ගලික තීරණ මත සහ පුද්ගලික අවංක බව මතය.

ගෝලීය චර්යා ධර්ම සංග්‍රහයේ සාකච්ඡා කෙරෙන සෑම ගැටළුවක්ම සෑම සේවකයකුටම අදාළ නොවුනත්, ලොව වටා සිටින සෑම සේවකයෙකුම ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව දැනුවත් වී එහි ප්‍රතිපත්ති තේරුම් ගෙන ඒවාට අනුකූල වන බව එලවේට් ටෙක්ස්ටයිල්ස් විශ්වාස කරයි. එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් අපේ සියළු පාලිත අනුප්‍රාප්තික සමාගම් මෙය පිළිපදින බවට වග බලා ගනියි. මීට අමතරව අපේ හවුල් ව්‍යාපාරිකයින්ටද අපේ බලපත්‍රලාභීන්ටද සංග්‍රහය ආධ්‍යාත්මයෙන් අනුගමනය කරමින් ව්‍යාපාර කිරීමට සිදු වන පරිදි අපි කටයුතු කරමු.

## ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය අනුගමනය කළ යුත්තේ කවුරුන්ද

සියළු සේවකයින් ගෝලීය චර්යා ධර්ම සංග්‍රහයේ සඳහන් මූලධර්ම සහ අවශ්‍යතාවලට අනුව කටයුතු කළ යුතු අතර එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙනුවෙන් කටයුතු කිරීමේදී ගෝලීය චර්යා ධර්ම සංග්‍රහයෙන් උපදෙස් පැතිය යුතුය. චර්යා ධර්ම සංග්‍රහයට පටහැනි වන කිසිම ක්‍රියාවක් සඳහා සේවකයින් විසින් දැන දැනම කොන්ත්‍රාත්කරුවකු, සැපයුම්කරුවකු, නියෝජිතයකු, උපදේශකයකු හෝ වෙනත් තෙවන පාර්ශ්වයක් භාවිතා නොකළ යුතුය. එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙනුවෙන් වැඩ කිරීමට කොන්ත්‍රාත්කරුවන්, නියෝජිතයන් හෝ උපදේශකයන් වැනි තෙවන පාර්ශ්ව භාවිතා කරන සේවකයින් මෙම පාර්ශ්වයන් චර්යා ධර්ම සංග්‍රහය දන්නා බවට වග බලා ගත යුතු අතර අදාළ අවස්ථාවලදී එය අනුගමනය කිරීමට සහාය ලබා දිය යුතුය.

## අවංක බව පිළිබඳ ගැටළුවලට පිළියම් යෙදීම

ගැටළුවක් දුටු විට හෝ ප්‍රශ්නයක් ඇති වූ විට කතා කිරීම අප සැමගේ වගකීමකි. එලවේට් ටෙක්ස්ටයිල්ස් හට ගැටළුව විසඳිය හැක්කේ එවිට පමණි. ඔබහට කිසියම් තත්ත්වයක් පිළිබඳ ප්‍රශ්න තිබේ නම්, හෝ ඔබ ගෝලීය චර්යාධර්ම සංග්‍රහය, අපගේ ප්‍රතිපත්ති හෝ නීතිය විෂමාචාරයක් හෝ උල්ලංඝනය කිරීමක් දුටුවේ නම් එය වාර්තා කරන්න. පහත දැක්වෙන ඕනෑම දෙයකින් ඔබට සහාය ලබාගත හැකිය:

- ඔබගේ කළමනාකරු
- ඔබගේ මානව සම්පත් කළමනාකරු
- ඔබ වාර්තා කරන දාමයේ අනෙක් කළමනාකරු(වන්)
- එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ආයතනික නීති අංශය
    - compliance@elevatetextiles.com
- එලවේට් ටෙක්ස්ටයිල්ස් හ සාමාන්‍ය නීති උපදේශන සහ ප්‍රධාන අනුකූලතා නිලධාරී
    - Kristen.hughes@elevatetextiles.com +1-704-951-2655

ඉහත ලැයිස්තුගත කර ඇති අයෙකු වෙත උල්ලංඝනය කිරීමක් පිළිබඳව වාර්තා කිරීම ඔබට පහසු නැතිනම් ඔබ හට විද්‍යුත් තැපෑලෙන් හෝ දුරකථනයෙන් රහස්‍යව හා නිර්නාමිකව වාර්තාවක් ඉදිරිපත් කිරීමට ඕනෑම කෙනෙකුට ඉඩ සලසන එලවේට් ටෙක්ස්ටයිල්ස් අවංකභාව ක්‍රියාවලිය භාවිතා කළ හැකිය.  ඔබ අවංකභාව ක්‍රියාවලිය හරහා වාර්තාවක් ඉදිරිපත් කරන විට එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙතට (ඔබ ඔබව හැඳින්වීම තෝරා නොගත්තොත්) හඳුනාගැනීමේ තොරතුරු ලබා දීමට හෝ සැපයීමට අවශ්‍ය නොවනු ඇත.  අවංකභාව ක්‍රියාවලිය හරහා වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා, රටවල් හට-විශේෂිත අවංකභාව ක්‍රියාවලිය අංක බැලීමට හෝ විද්‍යුත් ඉදිරිපත් කිරීමක් කිරීමට elevatetextiles.alertline.com වෙත පිවිසෙන්න.

සද්භාවයෙන් යුතුව කටයුතු සළකුණු කරන හෝ සද්භාවයෙන් යුතුව අනුකූලතා විභාගයකදී සහාය වන එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයකුට හෝ අනුකූලතාව පිළිබඳ ගැටළුවක් ඉදිරිපත් කරන අයකුට එදිරිවාදිකම් කිරීම හෝ පළි ගැනීම ගෝලීය චර්යා ධර්ම සංග්‍රය කඩ කිරීමකි. මීට අමතරව හුදෙක් පළි ගැනීම පමණක්ම මෙම ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීමක් වන අතර ගෝලීය චර්යා ධර්ම සංග්‍රය කඩ කළ ආකාරයටම ඒ ගැන වාර්තා කළ යුතුය. "සද්භාවයෙන්" යන්නට ඔබ නිවැරදි බව අදහස් නොවන නමුත් ඔබට තේරෙන පරිදි ඔබ ඇත්ත කියන බව අදහස් වේ.

## විමර්ශන හා විනය ක්‍රියාවලිය

ගෝලීය චර්යාධර්ම සංග්‍රහය, අපගේ ප්‍රතිපත්ති හෝ නීතිය හි කිසියම් උල්ලංඝනය කිරීමක් අපි ඉතා බැරෑරුම් ලෙස සලකමු. මෙහි ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කිරීම සහ මූලධර්මවලට ගරු කිරීම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ඔබගේ සේවය කිරීමේ එක් කොන්දේසියකි. මෙම ප්‍රතිපත්ති කඩ කරන ඕනෑම අධ්‍යක්ෂවරයකු, නිලධාරියකු හෝ සේවකයකු සේවයෙන් පහ කිරීමද ඇතුළු විනය ක්‍රියා මාර්ගවලට ලක් වනු ඇත.

එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් සිදුවිය හැකි විෂමාචාර හෝ උල්ලංඝනයන් පිළිබඳව ගැඹුරින් විමර්ශනය කරනු ඇත. එම තොරතුරු සැපයීම පෞද්ගලිකත්ව අභ්‍යර්ථ උල්ලංඝනය නොකරන්නේ නම් හා වැඩිදුර විමර්ශනයට හෝ පිළියම් යෙදීමට බාධාවක් නොවන්නේ නම්, විමර්ශනය සහ විනය ක්‍රියාවලියේ ප්‍රතිඵල වාර්තාව ඉදිරිපත් කරන්නන්ට ලබා දිය හැකිය.

## පුහුණුව සහ අධ්‍යාපනය

ගෝලීය චර්යා ධර්ම සංග්‍රහය ගැන සහ අදාළ සියළු අනුකූලතා ප්‍රතිපත්ති හා අදාළ නීති, නියෝග සහ නියමයන් (එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්ති) පිළිබඳ නිරන්තර පුහුණු සහ අධ්‍යාපන වැඩසටහනක් සංවර්ධනය කර නඩත්තු කරනු ඇත. මෙම පුහුණුවේ අරමුණ වන්නේ සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි අවශ්‍යතාවන්, ප්‍රතිපත්තිවලට අනුකූල වීමේ වැදගත්කම සහ ඒවා අනුව තම වගකීම් දැන සිටින බවට වග බලා ගැනීම වනු ඇත. අනුකූලතා සන්නිවේදන සහ පුහුණු වැඩසටහන සෑම එලවේට් ටෙක්ස්ටයිල්ස් ස්ථානයන්හි පැවෙත්වනු ඇත.

එලවේට් ටෙක්ස්ටයිල්ස් කම්හල් විසින් මෙම සංග්‍රහයේ අංගයන්, ඉලක්ක සහ අපේක්ෂාවන් පිළිබඳ සියළු සේවකයින්ට දැනුම් දී ඔවුන් පුහුණු කරනු ඇත.

සියළුම එලවේට් ටෙක්ස්ටයිල්ස් ස්ථානයන්හි ප්‍රධාන අධීක්ෂකවරුන්, කළමනාකරණ සහ විකුණුම් සහකරුවන් හට මෙම ගෝලීය චර්යාධර්ම සංග්‍රහය කියවීමට සහ එලවේට් ටෙක්ස්ටයිල්ස් ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට සහ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබේ. එයට අමතරව, සීමා කිරීමක් නොමැතිව නිදසුනක් ලෙස, කම්කරුවන් හට ඔවුන්ගේ පුහුණු, පැමිණීම සහ අනුකූලතාවය සහතික කරන ගෝලීය චර්යාධර්ම සංග්‍රහ ප්‍රකාශයක් සම්පූර්ණ කිරීම සඳහා වූ වැඩසටහනක් ඇතුළුව එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් ගෝලීය චර්යාධර්ම සංග්‍රයයේ විෂය පථය හා ප්‍රවේශ්‍යතාවය අධීක්ෂණය කරනු ඇත.

## පළකිරීමේ අවශ්‍යතා

එලවේට් ටෙක්ස්ටයිල්ස් කම්හල් විසින් මෙම සංග්‍රහය සියළු සේවකයින්ට සහ අමුත්තන්ට ලංවිය හැකි පහසු ස්ථානයක පළ කරනු ඇත.  මීට අමතරව, ගෝලීය චර්යාධර්ම සංග්‍රහය විවිධ භාෂාවලින් එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. ගෝලීය චර්යා ධර්ම සංග්‍රහයේ දෘඪ පිටපත් ඉල්ලුම මත ලබා ගත හැකිය.

# එලවේට් ටෙක්ස්ටයිල්ස් ව්‍යාපාරය තුළ අවංකභාවය

*අප එදිනෙදා ව්‍යාපාර කරන ආකාරය පාලනය කරන නීති*

## බැඳීයා පිළිගැටුම

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි සුභ සිද්ධිය ඔබේ පුද්ගලික සුභ සිද්ධිය නිසාවෙන් බාධා වුනොත් හෝ එසේ වන බව පෙනී ගියොත් බැඳීයා පිළිගැටුමක් ඇති වේ. ඔබ සැම විටම ව්‍යාපාරමය තීරණ ගත යුත්තේ ඔබේ සුභ සිද්ධියට වඩා එලවේට් ටෙක්ස්ටයිල්ස් හි අවශ්‍යතා අනුවය. නිදසුනක් වශයෙන් (i) ඔබට අරමුණක් ඇතිව සහ කාර්යක්ෂම ලෙස වැඩ කිරීමට අමාරුවන දේ කරන විට හෝ ඔබේ රුචීන් මගින් එසේ වැඩ කිරීම අපහසු වන විට; (ii) ඔබ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි දරන තනතුර හේතුවෙන් ඔබට හේ පවුලේ සාමාජිකයකුට අනිසි පුද්ගලික ප්‍රතිලාභයක් ලැබෙන විට; (iii) ඔබට හෝ ඔබේ පවුලේ සාමාජිකයන්ට එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් ණය දෙන විට හෝ ඔබේ හෝ ඔබේ පවුලේ අයගේ වගකීම් වෙනුවෙන් ඔබට සහතික වන විට බැඳීයා පිළිගැටුමක් ඇතිවිය හැකිය.

එලවේට් ටෙක්ස්ටයිල්ස් ප්‍රතිපත්තිය අනුව බැදියා පිළිගැටුම් වළකා ගත යුතුය. බැදියා පිළිගැටුම් සෑම විටම පැහැදිළිව දර්ශනය නොවේ. එනිසා ඔබට ප්‍රශ්නයක් තිබේ නම් ඉහළ මට්ටම්වල කළමනාකරුවන් ඇමතිය යුතුය. එවැනි පිළිගැටුමක් හෝ විය හැකි පිළිගැටුමක් පිළිබඳව ඔබ එය වාර්තා කළ යුතුයි.

## පුද්ගලික ව්‍යාපාරික සම්බන්ධතා

විශේෂයෙන්ම නිශ්චිතවම ඔබ එලවේට් ටෙක්ස්ටයිල්ස් සහ වෙනත් ව්‍යාපාර ආයතනයක් අතර වූ ගනුදෙනු සම්බන්ධයෙන් වූ ඔබේ තීරණවල ස්වාධීනත්වයට බලපාන කිසිම තනතුරක් නොදැරිය යුතු අතර එවැන්නක් ගැන සැහෙන උනන්දුවක්ද නොදැක්විය යුතුය.  ඔබේ පුද්ගලික ව්‍යාපාර සම්බන්ධතා ඔබ එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙනුවෙන් ගනු ලබන තීරණවලට කිසි විට බල නොපාන බවට ඔබ සහතික විය යුතුය.  වෙනත් කරුණු නැත්නම් පොදුවේ කොටස් විකුණනු ලබන සමාගමක තිබෙන කොටස් පන්ති ප්‍රමාණයෙන් සියයට එකකට (1%) අඩු ප්‍රමාණයක් අයිතිව තිබීම හේතුවෙන් බැදියා පිළිගැටුමක් ඇති නොවේ.

### ඥාතීන් සමග ව්‍යාපාර කිරීම

එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයකු විසින් එලවේට් ටෙක්ස්ටයිල්ස් සමග පුද්ගලික ලාභය පිණිස හෝ ඥාතියකුගේ ලාභය පිණිස ව්‍යාපාර කිරීමට සාමාන්‍ය නීති උපදේශන කමිටුව සහ ප්‍රධාන අනුකූලතා නිලධාරී හෝ ප්‍රධාන මානව සම්පත් නිලධාරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍යය.

### පාරිතෝෂික, ත්‍යාග සහ විනෝදාස්වාදය

අපගේ සාධාරණත්වයේ සම්මතයෙන් ඔබ්බට යන හෝ එලවේට් ටෙක්ස්ටයිල්ස් සමග ව්‍යාපාරයක් කරන ගනුදෙනුකරුවකු හෝ සැපයුම්කරුවකුගේ තත්ත්වයට වැටෙන කිසිම ගෙවීමක්, ත්‍යාගයක්, විනෝදාස්වාදයක් හෝ උදව් හෝ වැටුපක් කිසිම එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයකු විසින් ලබා ගැනීම හෝ ඊට එකග වීම නොකළ යුතුය.  සාමාන්‍ය ව්‍යාපාරික සබඳතා මාලාවේදී සාධාරණ, සෘතුමය හෝ ආනුෂංගික අයිතම සඳහා අවසර දෙනු ලැබේ.  මේ සම්බන්ධයෙන් කිසියම් සේවකයෙකුට ප්‍රශ්නයක් හෝ ගැටළුවක් ඇත්නම්, ඔහු/ඇය මඟ පෙන්වීම් සඳහා සාමාන්‍ය නීති උපදේශන කමිටුව සහ ප්‍රධාන අනුකූලතා නිලධාරී හෝ ප්‍රධාන මානව සම්පත් නිලධාරීගෙන් උපදෙස් ලබා ගත යුතුය.

### තරඟකාරී තොරතුරු ලබා ගැනීම

එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් නිසි ලෙස එකතු කරන ලද ව්‍යාපාරික තොරතුරු අගය කරයි. අපේ තරගකරුවන් පිළිබඳ තොරතුරු රැස් කර ගත යුත්තේ නිදහසේ අනෙක් අයටත් රැස් කළ හැකි පොදු මූලාශ්‍රවලින් පමණි. කිසිම එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයකු තරඟකාරී තොරතුරු ලබා ගැනීමට ඔත්තු බැලීම හෝ සොරකම් කිරීම නොකළ යුතුය.

### *ඔබේ වගකීම්*

- පුද්ගලික, පෞද්ගලික වාසි වලට වඩා නීති සහ සදාචාරාත්මක මූලධර්මවලට අනුකූල වීම.
- එලවේට් ටෙක්ස්ටයිල්ස් හි වන ඔබගේ වගකීම් හෝ රාජකාරිවලට බාධා විය හැකි තවත් ව්‍යාපාරයක තනතුරක් නොදැරීම හෝ මූල්‍ය ප්‍රතිලාභයක් ලබා නොගැනීම.
- එලවේට් ටෙක්ස්ටයිල්ස් සහ ඥාතියකු අතර ව්‍යාපාර නොකිරීම.
- කිසියම් බැදියා පිළිගැටුම් ප්‍රතිපත්ති කඩ කිරීමකදී වාර්තා කිරීම.
- සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් සමග කටයුතු කිරීමේදී සාමාන්‍ය වටිකාමකට වඩා වැඩි ත්‍යාග ලබා ගැනීමෙන් වැළකීම.
- ආදර්ශවත් වීමෙන් අනුකූලතාව දැක්වීම සහ චර්යා ධර්ම අනුව කටයුතු කිරීම - වෙනත් වචනවලින් සඳහන් කරන්නේ නම්, අවංකකමෙන් කටයුතු කිරීම යනු කුමක්දැයි ඔබේ හැසිරීමෙන් පෙන්වා දීම.

## ජාත්‍යන්තර වෙළඳ නීති

එලවේට් ටෙක්ස්ටයිල්ස් ලොව පුරා ව්‍යාපාර කටයුතු කරයි. සමහර අවස්ථාවල එක් රටකදී ගනු ලබන ක්‍රියා මාර්ග නිසා එලවේට් ටෙක්ස්ටයිල්ස් හට වෙනත් රටක එහි නීතිය යටතේ නෛතික පියවර වලට මුහුණ දීමට හේතු වනු ඇත. මෙය විශේෂයෙන් එක්සත් ජනපද නීති සම්බන්ධයෙන් සත්‍ය වේ. තරඟකාරීත්ව විරෝධී සහ වෙළඳ නියාමන නීති සංකීර්ණ වන අතර ඒවා මෙම මාර්ගෝපදේශයේ සම්පූර්ණයෙන් විස්තර කළ නොහැක. මේ නිසා එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් යම් යම් ගෝලීය වෙළඳ දෙපාර්තමේන්තු ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිවෙත් සාදා ඇති අතර තම රාජකාරිය කිරීමේදී මෙවැනි නීතිවලට යටත් විය හැකි එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් හට අමතර පුහුණුව ලබා දෙයි. කෙසේ වුවද මෙම නීති යටතේ පැන නැගිය හැකි ගැටළු පිළිබඳව මූලික අවබෝධයක් සියළු සේවකයින්ට තිබිය යුතු බවට එලවේට් ටෙක්ස්ටයිල්ස් නියම කරයි.

### විදේශීය දූෂණ ක්‍රියා පරිචය පනත

එලවේට් ටෙක්ස්ටයිල්ස් ක්‍රියාත්මක වන රටවල් ගණනාවක තරඟකාරීත්වයේ වාසිය අනිසි ලෙස ලබා ගැනීමට හෝ ප්‍රතිග්‍රාහකයාගේ තීරණ ගැනීමට වංචනික ලෙස බලපාන අල්ලස් ගෙවීම් හෝ වෙනත් අනිසි පෙළඹවීම් තහනම් කරමින් දූෂණ විරෝධී නීති ක්‍රියාත්මක වේ. උදාහරණයක් වශයෙන් එක්සත් ජනපද විදේශීය දූෂණ විරෝධී පනත (Foreign Corrupt Practices Act, “FCPA”) මගින් එම අරමුණු සඳහා කවර හෝ එක්සත් ජනපද සමාගමක් හෝ එහි ලෝක ව්‍යාප්ත අනුප්‍රාප්තික ආයතනයක්, අනුබද්ධ ආයතනයක්, සේවකයින් හෝ නියෝජිතයන් විසින් විදේශීය නිලධාරීන්, විදේශීය දේශපාලන පක්ෂ හෝ ඒවායේ නිලධාරීන්ට කෙළින්ම හෝ වෙනත් පුද්ගලයකු හරහා වක්‍රව ගෙවීමක් කිරීම තහනම් කිරීම දැක්විය හැක. (i) විදේශීය නිලධාරියකුගේ තීරණ ගැනීමේ හැකියාවට බලපෑම් කිරීම (ii) ගනුදෙනුවක් හෝ ව්‍යාපාරික වාසියක් ලබා ගැනීමට හෝ එය පවත්වා ගැනීමට. එක්සත් රාජධානි අල්ලස් පනතෙහිද (UK Bribery Act, “UKBA”) නිලධාරීන්ට (එනම් රාජ්‍ය නිලධාරීන් ඇතුළත් වන) සහ වෙළඳ අල්ලස් ලබා දීමට එරෙහිව සමාන වාරණයන් ඇත. බොහෝ අවස්ථාවලදී එක්සත් ජනපදයේ හෝ එක්සත් රාජධානියේ විදේශ නිලධාරීන් ලෙස නොසලකන අයව ඔවුන්ගේ රැකියා ස්ථානය රජයට අයත් හෝ රජය මගින් ඍජුව හෝ වක්‍රව ක්‍රියාත්මක වන එකක් නම් FCPA හෝ UKBA හි අරමුණ සඳහා විදේශීය නිලධාරීන් ලෙස සැලකිය හැක. එමනිසා ගෙවීමක් ලබා ගන්නා හෝ මුදල් නොවන ප්‍රතිලාභයක් ලබා ගන්නා අයකු ගැන මෙන්ම දූෂණ විරෝධී නීතියක් කඩ කිරීමේ අවදානමක් ඇති විදේශ නියෝජිතයන් භාවිතා කිරීමේදී ද විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

FCPA සහ UKBA ට සීමිත ව්‍යතිරේක සහ නෛතික රැකවරණ තිබුණද යම් ගෙවීමක් එම ව්‍යතිරේකවලට හෝ රැකවරණවලට අයත්වනවාද යන්න නෛතික ප්‍රශ්නයකි. සමහර අවස්ථාවලදී ගමන් හෝ නවාතැන් වියදම්, සේවා හෝ ප්‍රදර්ශන හෝ නිෂ්පාදන ප්‍රවර්ධනයට අදාළ වේ නම් හෝ ගිවිසුමක් ලියා අත්සන් කිරීමට අදාළ වේ නම් “සද්භාවී සහ සහේතුක වියදම්” සඳහා ගෙවීම් කිරීම හෝ ප්‍රතිපූරණය කිරීම කළ හැක. කෙසේ වුවද යම් වියදමක් ප්‍රතිපූරණය කර ගත හැකිද යන්න සහ ඒ කෙතරම් ප්‍රමාණයක්ද යන්න නෛතික ඇගයීමකි. කිසිම දූෂණ විරෝධී නීතියක් යටතේ එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් හෝ අනුබද්ධ ආයතන යෝජිත ගෙවීමක නීත්‍යනුකූලභාවය තක්සේරු කිරීමට තැත් නොකළ යුතුය. ඒ වෙනුවට ඔවුන් විදේශීය නිලධාරියකුට කරන ගෙවීමද ඇතුළුව දූෂණ විරෝධී ගැටළු ඇතිවිය හැකි ගෙවීම් පිළිබඳ, එය සිදු කිරීමට පෙර එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ආයතනික නීති අංශයෙන් විමසිය යුතුය. යම් පුද්ගලයකු FCPA හෝ UKBA යටතේ “විදේශීය නිලධාරියකුද” යන්නද ඒ ආකාරයටම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ආයතනික නීති අංශය විසින් තක්සේරු කළ යුතුය.

#### *ඔබේ වගකීම්*

- FCPA, UKBA සහ වෙනත් දූෂණ විරෝධී නීති තේරුම් ගැනීමටත් නිසි පියවර ගැනීමටත් එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශය අමතන්න.
- විදේශීය නිලධාරියකු වටිනා යමක් බලාපොරොත්තු වෙයි නම් එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශය අමතන්න.
- වෙනත් සමාගමක් එය කර ඇති නිසා යම් පුරුද්දක් පිළිගත හැකි බවට අනුමාන නොකරන්න.
- ඔබේ කළමනාකරුගෙන් හෝ එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශයහි අනුමැතිය රහිතව විදේශීය නියෝජිතයකුට වටිනා යමක් දීම හෝ දීමට පොරොන්දු වීම නොකරන්න.

### සංගත විරෝධී බව සහ සාධාරණ තරඟකාරීත්වය

එක්සත් ජනපදයේ සහ එලවේට් ටෙක්ස්ටයිල්ස් ක්‍රියාත්මක වන වෙනත් සියළු අධිකරණ බල සීමාවන්හි සියළු සංගත විරෝධී සහ තරඟකාරීත්ව නීතිවලට සම්පූර්ණයෙන් අනුකූල වන පරිදි සියළු මෙහෙයුම්, ක්‍රියාකාරීත්වයන් සහ ව්‍යාපාරික සම්බන්ධතා සිදුවන බවට වග බලා ගැනීම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තියයි. එලවේට් ටෙක්ස්ටයිල්ස් තරඟකරුවන් සමග නීතිවිරෝධී ගිවිසුම්වලට ඇතුළත් වීම, හෝ සැපයුම්කරුවන්, බෙදාහරින්නන් හෝ ගනුදෙනුකරුවන් සමග නීති විරෝධී වැඩ පිළිවෙළ යොදා ගැනීමද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවන තරඟකාරීත්වයට හානිවන සුළු නීති විරෝධී චර්යාවන්හි නොයෙදෙයි. සෑම විටම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වන්නේ ඉදිරිපත් කරන නිෂ්පාදන මොනවාද, ඒවා ඉදිරිපත් කරන්නේ කොතැනද කෙසේද යන්නත් ඊට අය කරන්නේ කෙතරම්ද යන්නත් ගැන තමාගේම ස්වාධීන තීරණ ගැනීම වන අතර ඉදිරියටද එය එසේම වනු ඇත.

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය මගින් මිල, මිල ප්‍රතිපත්ති, වට්ටම්, දීමනා හෝ වෙනත් විකිණුම් නියමයන් සම්බන්ධයෙන් තරඟකරුවකුගේ කිසිම නියෝජිතයකු සමග ගිවිසුමක් (හෝ ගිවිසුමක් ඇති කර ගැනීමේ උත්සාහයක්) නොතිබිය යුතු බවයි. මීට අමතරව තරඟකරුවන්, ගනුදෙනුකරුවන්, වෙළඳපළ ප්‍රදේශ වෙන් කර ගැනීමට හෝ යම් සැපයුම්කරුවකු හෝ ගනුදෙනුකරුවකු වර්ජනය කිරීමට හෝ තරඟකාරීත්වයට හානි වන යම් ක්‍රියාවක් කිරීමට හෝ නොකිරීමට තම තමන් අතර එකඟ නොවේ.

ඕනෑම නීතියකට අනුගත නොවීමෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් හට, එහි නිලධාරීන්ට සහ සේවකයින්ට සෑහෙන අවදානමක් ඇති වේ. සංගත විරෝධී නීති කඩ කිරීමේ දඬුවම් විශේෂයෙන් දැඩිය. එමගින් සමස්තයක් වශයෙන් එයට සම්බන්ධ වූ අයට සහ එලවේට් ටෙක්ස්ටයිල්ස් හට දීර්ඝ කාලීන බලපෑම් ඇති වනු ඇත.  ඒ අනුව සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් මෙම සංගත විරෝදී ප්‍රතිපත්තිය අනුව කටයුතු කිරීමට බැඳී සිටියි.
සෑම කාර්යාලයක්ම සහ සේවකයකුම එලවේට් ටෙක්ස්ටයිල්ස් ව්‍යාපාර සියළු අදාළ සංගත විරෝධී නීතිවලට අනුකූලව සිදු කෙරෙන බවට වගබලා ගත යුතු වෙයි.

සංගත විරෝධී සහ සාධාරණ තරඟකාරීත්ව නීති මගින් යම් වෙළඳපළ ඒකාධිකාරියක් පවත්වා ගැනීමට, පාලනය කරන සුළු වෙළඳපළ තනතුරු භාවිතා කිරීම හෝ වෙළඳපළට තරඟකරුවන් ඇතුළු වීම වැළැක්වීමට ස්වාභාවික වෙළඳපළ බලවේගවලින් බැහැරව, මිල පාලනය කිරීම තහනම් කරයි.

සංගත විරෝධී අනුකූලතාව සංකීර්ණ වන අතර නීතියෙහි ඇති අතිශයින් තාක්ෂණික ක්ෂේත්‍රයක් වෙයි. මේ ගැන ඔබට යම් ප්‍රශ්නයක් ඇත්නම් එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශය හෝ ඔබේ අධීක්ෂක අමතන්න.  මෙම ප්‍රතිපත්තිය කඩ කරන එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින්ට එරෙහිව සේවයෙන් පහ කිරීම ඇතුළු විනය ක්‍රියා මාර්ග ගනු ඇති අතර ඔවුන් සිවිල් සහ අපරාධ දණ්ඩනවලටද යටත් විය හැක.

***ඔබේ වගකීම්***

- එලවේට් ටෙක්ස්ටයිල්ස් හි තරඟකරුවකුගේ සේවකයින් සමග කිසිවිට නිල හෝ නොනිල වශයෙන් මිල හෝ නිෂ්පාදන ගැන සාකච්ඡා නොකරන්න.
- එලවේට් ටෙක්ස්ටයිල්ස් තරඟකරුවන් ගැන අසත්‍ය හෝ ද්වේශ සහගත ප්‍රකාශ කිසි විටෙක නොකරන්න.

**වෙළඳ සම්බාධක**

ඉඳහිට, රජය විසින් විදේශ රටවලින් සිදු කරන ආනයන හෝ විදේශ රටවලට සිදු කරන අපනයන සම්බන්ධයෙන් වෙළඳ හෝ සංචාරක සීමාවන් පනවනු ලැබේ.  එලවේට් ටෙක්ස්ටයිල්ස් හි එක්සත් ජනපද මෙහෙයුම් මූලික වශයෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි නිෂ්පාදනවල ගමනාන්තය සහ අවසන් පාරිභෝගිකයා සීමා කරනු ලබන එක්සත් ජනපද නීතිවලට යටත් වන අතර, ඊට විදේශීය රටක සිට තහනම් කළ ගමනාන්තයක් හෝ අවසන් පාරිභෝගිකයෙකු වෙතින් ප්‍රති-අපනයනය කෙරෙන නිෂ්පාදනද ඇතුළත් වේ. සමහර අවස්ථාවල, සමහර භාණ්ඩ නිෂ්පාදනය කෙරුණේ කුමන රටේද යන්න සැලකිල්ලට නොගෙන, යම් යම් ගමනාන්ත වෙත නැව්ගත නොකෙරෙනු ඇත. එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වනුයේ යම් යම් රටවල් සමඟ වන වෙළඳාම සීමා කරනු පිණිස පනවා ඇති සියළු නීති රීතිවලට අනුකූල වීම වන අතර අපනයනය හා සම්බන්ධ වන සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් පිරිස් ඔහුගේ හෝ ඇයගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට අදාල රෙගුලාසි සහ කාර්ය පටිපාටි පිළිබඳ හුරුවක් ලබා ගැනීම වැදගත්ය.

***ඔබේ වගකීම්***

- අපනයන පාලන නීති රීති එක්සත් ජනපද නොවන විකුණුම්වලට අදාළ නොවේ යැයි නොසිතන්න.
- කිසියම් වෙළඳ නීතියක් හා අනුකූල වීම පිළිබඳව ඔබට කිසියම් ප්‍රශ්න හෝ ගැටළු ඇතොත් කරුණාකර එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනයේ නීති අංශය විමසන්න.

**වර්ජන විරෝධීබව**

එක්සත් ජනපද වර්ජන විරෝධී නීති මඟින් එක්සත් ජනපද රජය මඟින් තහනම් නොකළ වර්ජනයකට සහාය පිණිස වෙනත් පුද්ගලයෙකු සමඟ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම හෝ වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රතික්ෂේප කිරීම එලවේට් ටෙක්ස්ටයිල්ස් (එයින් පාලනය වන විදේශීය උප ආයතන හා අනුබද්ධ ආයතන ද ඇතුළුව) හට තහනම් කෙරේ.  වර්ජනයකට සම්බන්ධ වීම සඳහා එලවේට් ටෙක්ස්ටයිල්ස් සහ එහි උප ආයතන හෝ අනුබද්ධ ආයතන වෙත ලැබෙන ඉල්ලීම් එක්සත් ජනපද රජයට වාර්තා කිරීමට එක්සත් ජනපද නීති මඟින් නියම කරනු ලැබේ. කිසියම් වර්ජනයක් ව්‍යාප්ත කරනු පිණිස හෝ ඊට සහාය දැක්වීම සඳහා බලපෑම් සිදු කළ හැකි ක්‍රියා මාර්ගයක් ගැනීමට හෝ ක්‍රියා මාර්ගයක් නොගැනීමට යම් එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයෙකු වෙත කිසියම් ලිඛිත හෝ වාචික ඉල්ලීමක් ලැබුණහොත්, ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් ඔහු/ඇය වහාම එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනයේ නීති අංශය වෙත වාර්තා කර උපදෙස් ලබා ගත යුතුය.

***ඔබේ වගකීම්***

- වර්ජනයකට සහභාගී වීම සඳහා වන කිසියම් ඉල්ලීමක් ලැබුණහොත් ඒවා සම්බන්ධයෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනයේ නීති අංශය වෙත වහාම වාර්තා කිරීම.

**ආරක්ෂාව**

එය අපගේ නිෂ්පාදන, ගුදම්, සහ නැව්ගත කිරීමේ ක්‍රියාවලි හා අදාළ වන බැවින් ප්‍රවේශ, පුද්ගල, කාර්ය පටිපාටිය, සහ කායික ආරක්ෂාව හා අදාළ මනා පරිචයන් සම්බන්ධයෙන් අනුකූලභාවය පවත්වා ගැනීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් කැප වී සිටියි.

ප්‍රකාශිතව දක්වා නොමැති නැව් භාණ්ඩ නැව්ගත කිරීම් තුළට ඇතුළු කිරීමෙන් ආරක්ෂා වීම සඳහා වන ආරක්ෂණ කාර්ය පටිපාටි එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනය හා එහි සේවකයින් විසින් පවත්වා ගත යුතුය අතර, ඊට එක්සත් ජනපදය වෙත නැව්ගත කිරීම සඳහා වන ත්‍රස්ත විරෝධී රේගු-වෙළඳ හවුල්කාරීත්ව නියමයන් (Customs-Trade Partnership Against Terrorism, C-TPAT) ඇතුළත් වන අතර ඊට පමණක් සීමා නොවේ.

එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතන සියළු අදාළ රේගු නීතිවලට අනුකූල විය යුතු අතර ලොව පුරා සිටින නිසි රේගු බලධාරීන් සමඟ කටයුතු කරන අතරතුර නීතිවිරෝධී භාණ්ඩ නැව්ගත කිරීම්වලින් ආරක්ෂා වීම පිණිස වන වැඩසටහන් ස්ථාපිත කර පවත්වා ගත යුතුය.

## දේශපාලන ක්‍රියාකාරකම් සහ දායකත්වයන්

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි මූල්‍යමය සහ අනෙකුත් සම්පත් සෘජුව හෝ වක්‍රව කිසියම් දේශපාලන නිලයක අපේක්ෂකයෙකු හට ආධාර කිරීමේ, කිසියම් සෘජු හෝ වක්‍ර දේශපාලන දායක මුදලක් ප්‍රතිපූරණය කිරීම, හෝ කිසියම් රජයේ නිලධාරියෙකුට හෝ සේවකයෙකුට ගෙවීම් සිදු කිරීම, පරිත්‍යාග, හෝ ත්‍යාග ලබා දීම පිණිස යොදා නොගත යුතුය. සියළුම එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවක පිරිස් ඔහුගේ හෝ ඇයගේ කාලය සහ සම්පත් යොදා ගනිමින් පුද්ගලික දේශපාලන ක්‍රියාකාරකම් හි නිරත වීම එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් දිරි ගන්වන්නේ නැත.

## නීති හා අනුකූල වීම

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි මෙහෙයුම්, ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සියල්ල එලවේට් ටෙක්ස්ටයිල්ස් කටයුතු කරන සෑම අධිකරණ බලසීමාවක් තුළම වන අදාල සියළු නීතිවලට සම්පූර්ණ වශයෙන්ම අනුකූලව සිදු කරනු ලබන බවට වග බලා ගැනීම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වේ.

නීතිය නිසි අයුරින් පිළිපැදීම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි සදාචාරාත්මක ප්‍රමිතිවල පදනම වේ. සියළු අදාල නීතිවල විස්තර අප සියළු දෙනා දැන සිටිය යුතු බවට අපේක්ෂා නොකෙරෙන නමුත්, අධීක්ෂකවරුන්ගෙන්, කළමනාකරුවන්ගෙන්, සහ එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනයේ නීති අංශයෙන් උපදෙස් ලබා ගත යුත්තේ කුමන අවස්ථාවකදී දැයි තීරණය කිරීමට තරම් ප්‍රමාණවත් දැනුමක් තිබීම වැදගත් වේ.

## ගුණාත්මකභාවය සහ පරීක්ෂා කිරීම

ලෝකයේ ඉහළම ගුණාත්මකභාවයෙන් යුත් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන නිෂ්පාදන හා සේවා ලබා දීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් ඇප කැප වී සිටී. ලෝකයේ ඉහළම ගුණාත්මකභාවය අපගේ සාර්ථකත්වය සඳහා තීරණාත්මක වන අතර අපගේ ක්‍රියාවලි අඛණ්ඩව වැඩිදියුණු කිරීම තුළින් එය සාක්ෂාත් කර ගනු ලබන අතර එය අවම වෙනස්කමක් සහිතව ඉලක්කය තුළ රැඳී සිටීම ලෙස අර්ථ දැක්වේ. සියළු ලිපි ලේඛන නිවැරදිව සහ ඉක්මණින් සම්පූර්ණ කළ යුතුය.

# එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවා ස්ථානය තුළ අවංකව කටයුතු කිරීම

*අප එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් ලෙස ජීවත් වන සහ වැඩ කරන ආකාරය පාලනය කෙරෙන නීති*

## මිනිසුන්ට සාධාරණ ලෙස සැලකීම

### සම අවස්ථා සේවානියුක්තිකයා

එලවේට් ටෙක්ස්ටයිල්ස් යනු සමාන අවස්ථා (එසේම එක්සත් ජනපදය තුළ අවධාරණය කෙරෙන ක්‍රියාවකි) ලබා දෙන සේවානියුක්තිකයෙකි. එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වනුයේ සුදුසුකම් සහිත සියළු සේවකයින්ට සහ සුදුසුකම් සහිත සියළු අයදුම්කරුවන්ට සමාන සේවානියුක්ති අවස්ථා ලබා දීම වන අතර එහිදී නීත්‍යානුකූල නොවන ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, ජාතික සම්භවය, වයස, ආබාධිතභාවය, හමුදාවේ සේවය කර තිබේද වැනි කරුණු හෝ වෙනත් අදාල නීති මඟින් ආරක්ෂා කර ඇති වර්ගීකරණයක් සැලකිල්ලට නොගැනේ. මෙම ප්‍රතිපත්තිය සේවා නියුක්තියේ සියළු නියමයන් හා කොන්දේසිවලට අදාල වන අතර එය බඳවා ගැනීම, ප්‍රතිලාභ ලබා දීම, ස්ථාන මාරු කිරීම්, වන්දි ලබා දීම, උසස් වීම් ලබා දීම, සේවයට නොපැමිණීමේ අවසරය, සේවයෙන් නෙරපීම, සහ සේවා විරාමය වැනි දෑ ඇතුළත් වන අතර, ඒවාට පමණක් සීමා නොවේ.

### වෙනස් ආකාරයට නොසැලකීම/හිංසා නොකිරීම

සියළුම එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවක පිරිස් සම සේවානියුක්ති අවස්ථා සම්බන්ධයෙන් සහ කිසියම් ආකාරයක නීති විරෝධී හිංසා කිරීමක් හෝ වෙනස් ආකාරයට සැලකීමකට කිසිදු ආකාරයකට ඉඩ නොදීම සම්බන්ධයෙන් වන අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම තම සහාය ලබා දිය යුතු බවට අප ඉල්ලා සිටින සහ නියම කරන අතර, කිසියම් උල්ලංඝන කිරීමක් පිළිබඳව දැනගත් වහාම ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අතර, එම උල්ලංඝනය කිරීමට සම්බන්ධ වූ කිසියම් කළමනාකරුවෙකු හෝ අධීක්ෂකයෙකුද සම්බන්ධ කර ගනිමින් සේවයෙන් නෙරපීම දක්වා වූ නිසි විනය ක්‍රියාමාර්ගයකට එම උල්ලංඝනය යටත් වනු ඇත.

සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවක පිරිස් ගෞරවයෙන් සහ බුහුමානයෙන් යුක්තව සලකනු ලැබීමට හිමිකම් ලබයි. එබැවින් සමාගම කිසිදු නීති විරෝධී හිංසනයෙන්, බිය වැද්දීමෙන්, සහ ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, ජාතික සම්භවය, වයස ආබාධිතභාවය, හමුදාවේ සේවය කර තිබේද වැනි කරුණු හෝ වෙනත් අදාල නීති මඟින් ආරක්ෂා කර ඇති වර්ගීකරණයක් මත පදනම්ව හෝ සම්බන්ධයෙන් බලහත්කාරකම් සිදු කිරීම්වලින් තොර සේවා පරිසරයක් සැපයීමට ඇප කැප වී සිටිමු. එවැනි හැසිරීමක් සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවක පිරිස් සඳහා වන අන්‍යෝන්‍ය ගරුත්වයේ දර්ශනය හා අනුකූල නොවන අතර එවැනි හැසිරීමක් සඳහා ඉඩ ලබා දෙනු නොලැබේ.

අනිසි හිංසනය සහ වෙනත් තහනම් කර ඇති හැසිරීම යන්නට පහත දැක්වෙන දෑ ඇතුළත් විය හැකි නමුත් ඒවාට පමණක් සීමා නොවේ:

- පුද්ගලයෙකුගේ පෙනුම, ශරීරය, හෝ පුද්ගලික ජීවිතය ගැන එම පුද්ගලයා අකමැති අදහස් ප්‍රකාශ කිරීම
- සාවද්‍ය හෝ අපහරණාත්මක ආකාරයට ශරීරය ස්පර්ශ කිරීම
- එම පුද්ගලයා අකමැති, සාවද්‍ය විසුළු නාම හෝ ප්‍රේමාන්විත පද භාවිතා කිරීම
- අසභ්‍ය විහිළු, අප්‍රියජනක වක්‍රෝක්ති, ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, ජාතික සම්භවය, වයස, ආබාධිතභාවය, හමුදාවේ සේවය කර තිබේද වැනි කරුණු හෝ වෙනත් අදාල නීති මඟින් ආරක්‍ෂා කර ඇති වර්ගීකරණයක් සම්බන්ධයෙන් නොගැලපෙන අදහස් ප්‍රකාශය කිරීම හෝ තර්ජනය කිරීම
- කිසියම් තැනැත්තෙකුගේ රැකියාව, උසස් වීම් ලබා දීම, කාර්යසාධනය ඇගයීම හෝ වැඩ කිරීමේ තත්ත්වයන්ට බලපෑ හැකි ලිංගික ක්‍රියාකාරකම්, ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, ජාතික සම්භවය, වයස ආබාධිතභාවය, හමුදාවේ සේවය කර තිබේද වැනි කරුණු හෝ වෙනත් අදාල නීති මඟින් ආරක්‍ෂා කර ඇති වර්ගීකරණ සම්බන්ධයෙන් සිදු කෙරෙන යෝජනා
- අසභ්‍ය වස්තු හෝ ඡායාරූප ප්‍රදර්ශනය කිරීම, බෙදාහැරීම හෝ සංසරණය කිරීම; හෝ
- යම්කිසි එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයකුට විරුද්ධ විය නොහැකි වුවත්, අනෙක් අය විසින් සැලකිය යුතු තරම් අසභ්‍ය හෝ එදිරිවාදී යැයි සැලකිය හැකි වැඩ කිරීමේ පරිසරයක් නිර්මාණය කෙරෙන වෙනත් හැසිරීම්. ලිංගික අඬත්තේට්ටම්, විශේෂයෙන්ම අකමැත්තෙන් සිදු කරන ලිංගික චර්යාවන්, ලිංගික හැසිරීම් සඳහා වන ඉල්ලීම්, හෝ වෙනත් ලිංගික ආකාරයේ වාචික හෝ කායික හැසිරීම් පහත දක්වා ඇති ආකාරයට එකක් හෝ කිහිපයක් හට ගන්නා විට:
    - එවැනි හැසිරීමකට භාජනය වීම, ප්‍රතික්ෂේප කිරීම හෝ දරා ගැනීම කිසියම් පුද්ගලයෙකුගේ සේවානියුක්තිය තුළ ප්‍රකාශිත හෝ අප්‍රකාශිත තත්ත්වයක් බවට පත් වීම;
    - එවැනි හැසිරීමකට භාජනය වීම, ප්‍රතික්ෂේප කිරීම හෝ දරා ගැනීම උසස් කිරීම්, තත්වයෙන් පහතට දැමීම, සේවයෙන් නෙරපීම, හෝ වැටුප වැනි සේවානියුක්තිය හා අදාල තීරණ ගැනීමට භාවිතා කිරීම; හෝ
    - කිසියම් සේවකයෙකුගේ වැඩ කාර්යසාධනයට සැලකිය යුතු තරම් බලපාන, හෝ එදිරිවාදී, බියවද්දන, හෝ අසභ්‍ය වැඩ කිරීමේ පරිසරයක් නිර්මාණය කරන තත්ත්වයක්.

ඉහත දැක්වෙන කරුණු නොමනා හැසිරීම් සඳහා උදාහරණ කිහිපයක් පමණි. කුමන ආකාරයේ වුවද අකමැත්තෙන් සිදු කරන අපහරණයක්, වෙනස් ආකාරයට සැලකීමක් හෝ අඬත්තේට්ටම් කිරීමක් ඇති වුවහොත්, එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් එය බැරෑරුම් ලෙස සලකනු ලැබේ. එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ඒ සඳහා කිසිදු ඉඩක් නොලැබේ.

## මත්ද්‍රව්‍යවලින් තොර සේවා ස්ථානයක්

සියළු සේවකයින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ක්‍රියාකාරකම්වල නොයෙදෙන බවට වග බලා ගැනීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් ඇප කැප වී සිටී. මෙම ඉලක්කය කරා ළඟා වනු පිණිස, එලවේට් ටෙක්ස්ටයිල්ස් මඟින් මත්ද්‍රව්‍ය අනිසි භාවිතය හා අදාල ප්‍රතිපත්තියක් ස්ථාපිත කර තිබේ.

මෙම ප්‍රතිපත්තිය උල්ලංඝනය කරන සේවකයින්ට එරෙහිව සේවයෙන් නෙරපීම ඇතුළුව ඒ දක්වා වන විනය සුදුසු ක්‍රියාමාර්ග එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් ගනු ඇත. දේශීය නීතිය මඟින් ඉඩ දී ඇති ප්‍රමාණයට, කිසියම් එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයෙකු තහනම් මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බවට සැක කිරීම හෝ පාලනය කර ඇති මත් ද්‍රව්‍ය භාවිතය හෝ අනිසි භාවිතය හේතුවෙන් ඔහු හෝ ඇය වැඩ කිරීම සඳහා යෝග්‍යදැයි පරීක්‍ෂා කිරීමේ බලය එලවේට් ටෙක්ස්ටයිල්ස් සතු වේ.

මෙම ප්‍රතිපත්තිය සැකසහිත උල්ලංඝනයක් පිළිබඳ සියළු තොරතුරු කිසියම් යෝග්‍ය මානව සම්පත් දෙපාර්තමේන්තු සේවක පිරිස් වෙත හෙළිදරව් කිරීමට සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවක පිරිස සතුව අවධාරණාත්මක වගකීමක් තිබේ.

## මානව හිමිකම් සහ කම්කරු ක්‍රියාකාරකම්

එලවේට් ටෙක්ස්ටයිල්ස් සිය ගෝලීය නිෂ්පාදන සහ බෙදාහාරීමේ ආයතන ඇතුළුව එහි සැපයුම් දාමය පුරා වහල් වෙළඳාම සහ මිනිස් ජාවාරම වැළැක්වීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් ඇප කැප වේ. සිය සේවක පිරිස්, කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් අදාල සියළු නෛතික නියමයන් සපුරාලිය යුතු බවට එලවේට් ටෙක්ස්ටයිල්ස් අපේක්‍ෂා කරයි.

## ළමා ශ්‍රමය සහ බලෙන් ලබා ගන්නා ශ්‍රමය

එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් සේවා ස්ථානය තුළ කිසිදු නිත්‍යානුකූල නොවන ළමා සේවානියුක්තියක් සිදු කිරීමක් සිදු නොකරන අතර එවැන්නක් සඳහා සමාව නොදේ, එසේම කිසිදු ආකාරයක බලෙන් ලබා ගන්නා ශ්‍රමය භාවිතා කිරීම හෝ එවැන්නක් සඳහා සමාව දීම සිදු නොකරයි. සේවානියුක්තිය සඳහා එලවේට් ටෙක්ස්ටයිල්ස් සතුව අවම වයසක් පවතින අතර එය වයස අවුරුදු 16 වේ, එනම් එය පාසල් යාමේ අවම අනිවාර්ය වයස වේ. එසේම අපි එක්සත් ජාතීන්ගේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයට ගරු කරමු.

## වගකීමකින් යුතු බඳවා ගැනීම් සඳහා කැපවීම

අපගේ සැපයුම් දාමයේ සේවකයින් හට සාධාරණ ලෙස සැලකීමට අපි කැපවී සිටිමු. මෙම අඛණ්ඩ වෑයමේ කොටසක් ලෙස, අප නිෂ්පාදන ලබා ගන්නා රටවල්වල බලහත්කාරයෙන් වැඩ කිරීමට හේතු විය හැකි කොන්දේසි තුරන් කිරීම සඳහා අපගේ කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අපි දිගටම කටයුතු කරන්නෙමු.

අපගේ සේවකයින් සහ අපගේ සැපයුම් දාම හවුල්කරුවන් විසින් සේවා කොන්දේසි නිර්මාණය කිරීම සහතික කිරීමට අපි කැපවී සිටිමු:

- කිසිදු කම්කරුවෙකු ඔවුන්ගේ රැකියාව සඳහා ගෙවන්නේ නැත;
- කම්කරුවන් හට ඔවුන්ගේ ගමන් ලියකියවිලි පාලනය කර තබා ගැනීමට සහ ගමන් කිරීමේ පූර්ණ නිදහස ඇත; හා
- සියළුම කම්කරුවන් හට නිවසින් පිටවීමට පෙර ඔවුන්ගේ රැකියාවේ මූලික කොන්දේසි පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

### වැඩ කරන වේලාව
එලවේට් ටෙක්ස්ටයිල්ස් සහායකයකු අදාළ නීතියෙන් අවසර දී ඇති සාමාන්‍ය හා අතිකාල පැයවලට වඩා වැඩ නොකළ යුතුය. සුවිශේෂී අවස්ථාවන්හිදී හැර අනෙක් සෑම දින හතකටම අඛණ්ඩව පැය 24 ක විවේකයක් ලබා දිය යුතුය. සියළු අතිකාල සේවා සම්මුතියක් අනුව සිදු වනු ඇත. එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් අතිකාල සේවා වේලාවන් ප්‍රවේශමෙන් අධීක්ෂණය කරනු ඇති අතර සියළු අතිකාල වැඩ වාරික අනුපාතයකට හානිපූර්ණය ලබා දෙනු ඇත. සුවිශේෂී තත්ත්වයන් හැරුණු විට, සතියක මුළු නිත්‍ය සහ අතිකාල පැය ගණන පැය 60 නොඉක්මවනු ඇත.

### වේතන
ඔවුන්ගේ සෑම කර්මාන්ත ශාලාවකම තරඟකාරී වේතන ලබා දීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් කැප වී ක්‍රියා කරයි, එසේ නමුත් එහි එක් එක් මෙහෙයුම්වලට අදාල අවම දේශීය වේතනවලට වඩා අඩු නොවන බවට එය වග බලා ගනී. සියළු වේතන සහ අතිකාල දීමනා ලබන සේවකයින්හට ක්‍රියාකාරීත්වය හා අදාල දේශීය නීතිවලට අනුව අතිකාල ගෙවනු ලැබේ.

### සේවා ස්ථාන තර්ජන සහ ප්‍රචණ්ඩත්වය
එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවක පිරිස්, ගනුදෙනුකරුවන්, වෙළෙන්දන්, හෝ වෙනත් පුද්ගලයින් රාජකාරියේ යෙදෙන කාලය තුළ හෝ එලවේට් ටෙක්ස්ටයිල්ස් දේපලක් තුළ සිටි කාලයක් තුළ තර්ජන සිදු කිරීම, තර්ජනාත්මක හැසිරීම්, කෝලාහලාත්මක ක්‍රියාවන්, හෝ හිංසන කාරී ක්‍රියාවන්හි යෙදීම තහනම් වේ. ඊට අමතරව, රාජකාරී වේලාවන්ට බැහැර අවස්ථාවලදීද තර්ජන සිදු කිරීම, තර්ජනාත්මක හැසිරීම්, කෝලාහලාත්මක ක්‍රියාවන්, හෝ හිංසන කාරී ක්‍රියාවන්හි යෙදීම තහනම් වේ. මෙම ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමෙන් එම පුද්ගලයා සේවයෙන් නෙරපීම ඇතුළුව ඒ දක්වා වන විනායානුකූල ක්‍රියාමාර්ගවලට යටත් වේ.

### සාමූහික කේවල් කිරීම
තමන්ගේ ගැටළු කියා පෑමට සහ සාමූහිකව කේවල් කිරීමට සේවකයින් සතු හිමිකම එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් හඳුනා ගනු ලබන අතර ඊට ගරු කරයි. අපගේ සේවකයින් තමන් නියෝජනය කිරීම සඳහා සාමූහික වශයෙන් කිසියම් වෘත්තීය සමිති, වෘත්තීය සංගම් සහ වෙනත් සංවිධාන තෝරා ගතහොත් ඔවුන් සමඟ සද්භාවයෙන් හෝ අදාල නීතිය මඟින් නියම කර ඇති ආකාරයට, අදාල නීති රාමුව තුළ රැඳී සිටිමින් කටයුතු කිරීමට අපි උත්සාහ දරමු.

## වංචනික හැසිරීම
ජාත්‍යන්තර වශයෙන් වෙනත් පුද්ගලයෙකු හෝ ව්‍යාපාරයක් යම් ගනුදෙනුවක් තුළදී රැවටීමට හෝ වංචාවට ලක් කරන එලවේට් ටෙක්ස්ටයිල්ස් පුද්ගලයෙකු එලවේට් ටෙක්ස්ටයිල්ස් ව්‍යාපාරික කටයුතු කරන අධිකරණ බලසීමාවන්හි සාපරාධී මෙන්ම සිවිල් නීතිද, සියළු නොවේ නම් බොහෝමයක් උල්ලංඝනය කරන්නෙකු වේ. ඊට අමතරව, දුරකථන, ෆැක්ස්, ඊමේල් හෝ තැපැල් මාර්ගයෙන් සිදු කෙරෙන එවැනි ගනුදෙනු සම්බන්ධව සිදු කෙරෙන සාකච්ඡාවලින් වංචනික හිමිකම්පෑම් වැඩි කෙරෙනු ඇත. වංචාවන් පිළිබඳ එක්සත් ජනපද නීති දූරදර්ශී ඒවා වන අතර කිසියම් උල්ලංඝනයක් සිදු කෙරුණහොත් එම එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් දඩ සහ සිර දඬුවම්වලට යටත් විය හැකිය. එවැනි වගකීම් මඟහරවා ගැනීමට, එලවේට් ටෙක්ස්ටයිල්ස් නිෂ්පාදන ගනුදෙනුකරුවන් වෙත ලබා දීමේදී, රජයේ බැංකුවක් වෙත කෙරෙන කිසියම් ගොනු කිරීමකදී හෝ වාර්තා කිරීමකදී, එසේ නැතහොත් ඊට සමාන ලේඛන තුළ හිතාමතා සිදු කෙරෙන වැරදි නියෝජන නොමැති බවට සහතික වනු පිණිස එලවේට් ටෙක්ස්ටයිල්ස් පුද්ගලයින් විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් කිසිදු වංචනික පැවැත්මකට සමාව නොදෙන අතර සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් අදාල සියළු නීතිවලට අනුකූලව කටයුතු කිරීම අනිවාර්ය වේ.

## පාරිසරික සෞඛ්‍යය සහ නිරපදා ප්‍රතිපත්ති
### සෞඛ්‍යය සහ නිරපදාව
එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය, සේවා ස්ථානයේ සෞඛ්‍යය සහ නිරපදාව වනුයේ සියළු ෆෙඩරල්, පළාත්, ප්‍රාන්ත සහ ප්‍රාදේශීය නීති පිළිපැදිය යුතුයි යන්නයි. සියළු සෞඛ්‍ය හා නිරපදා නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සඳහා, මෙන්ම ඔහුගේ හෝ ඇයගේ රාජකාරී කටයුතු ඉටු කිරීමේදී නිරපදාව නිරන්තරව ප්‍රගුණ කිරීම සඳහාද එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් වගකිව යුතුය. සියළු උපකරණ, මෙවලම් සහ යන්ත්‍ර මනාව අලුත්වැඩියා කර පවත්වා ගනිමින්, සහ ආරක්ෂිත වැඩ ක්‍රම සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කරමින්, සංවර්ධනය කරමින් සහ සේවකයින් පුහුණු කිරීම තුළින් ආරක්ෂිත වැඩ කිරීමේ තත්ත්වයන් සහතික කිරීම පිණිස සාධාරණ ආරක්ෂණයන් සැපයීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් කැප වී සිටී. ඊට අමතරව, එලවේට් ටෙක්ස්ටයිල්ස් දේපළක් තුළ ගිනි අවි හෝ ආයුධ ළඟ තබා ගැනීම එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් තහනම් කරනු ලැබේ.

මෙම නීති උල්ලංඝනය කරන එලවේට් ටෙක්ස්ටයිල්ස් පුද්ගලයින් ඔවුන්ට පමණක් නොව, අන් අයටද හානි කරයි. නිරපදා කාර්ය පටිපාටියේ හෝ වෙනත් නිරපදා කරුණක් උල්ලංඝනය කෙරෙන බවට වන කිසියම් සැක කිරීමක් වෙතොත් ඒ සඳහා සුදුසු පිළියම් යෙදිය හැකි වන පරිදි වහාම ඔබේ අධීක්ෂක වෙත වාර්තා කළ යුතුය.

### පාරිසරික ප්‍රතිපත්ති
පරිසරය ආරක්ෂා වන ආකාරයට අපගේ කටයුතු සිදු කිරීම එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වේ. අවම වශයෙන්, මෙහි අදහස වනුයේ එලවේට් ටෙක්ස්ටයිල්ස් අප කටයුතු කරන එක් එක් රටකම අදාල සියළු නීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවය. දේශීය පාරිසරික නීති සහ රෙගුලාසි නොමැති නම් හෝ එතරම් දැඩි නොවේ නම්, එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ජාත්‍යන්තර පාරිසරික, සෞඛ්‍යය සහ නිරපදා ප්‍රතිපත්ති සහ ප්‍රමිති අනුගමනය කෙරෙනු ඇත.

සමාගම් සිය සැපයුම්කරුවන් විසින් සපුරාලිය යුතු ලෝක ව්‍යාප්ත පාරිසරික, සෞඛ්‍ය සහ නිරපදා ප්‍රමිති නිරතුරුව ස්ථාපිත කරයි. අපගේ පාරිසරික, සෞඛ්‍ය සහ නිරපදා ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි නිර්මාණය කර ඇත්තේ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ගනුදෙනුකරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමිති සපුරාලීම හෝ ඉක්මවීම පිණිසය.

එලවේට් ටෙක්ස්ටයිල්ස් විශ්වාස කරනුයේ ආරක්ෂිත සහ යහපත් පරිසරයක් සෑම පුරවැසියෙකුගේම සහ සෑම වගකිව යුතු ව්‍යාපාරයකම යුතුකම වන බව වන අතර එහි අරුත වනුයේ වත්මන් පරම්පරාව මෙන්ම අනාගත පරම්පරාවන් වෙනුවෙන් පරිසරය ආරක්ෂා කිරීමේ නායකත්ව කාර්යභාරයක් එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් ඉටු කළ යුතු බවය. පරිසරය සම්බන්ධයෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි කැපවීම ප්‍රකාශ වනුයේ නිෂ්පාදන ක්‍රියාවලියේ අතුරු නිෂ්පාදන වාතයට, ගොඩබිමට හෝ ජලයට අහිතකර ලෙස බල නොපාන බවට සහතික කර ගැනීම සඳහා වන උපකරණ සහ වැඩසටහන්වලට දරන වියදම මඟිනි.

අපගේ ගනුදෙනුකරුවන්ට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඇසුරුම් සහිත නිෂ්පාදන මිලදී ගැනීම සහ පිළිගැනීම සහ අපගේ සැපයුම්කරුවන්ට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි භාණ්ඩ සහ භාණ්ඩ ඇසුරුම් නිර්මාණය කිරීම දිරි ගැන්වීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් කැප වී සිටී.

අපගේ ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමට අපගේ ප්‍රජාව, පවුල් සහ සේවකයින් දිරිගැන්වීමට සහ ඔවුන්ගේ දෛනික ජීවිතය තුළ පරිසරය වඩා හොඳින් ආරක්ෂා කිරීම දිරිගැන්වීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් ඇප කැපවී කටයුතු කරයි.

### ගෝලීය තිරසාරත්වය සම්බන්ධයෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි නිරන්තර කැපවීම

පාරිසරික, සෞඛ්‍ය සහ නිරපදාව (Environmental, Health and Safety, EHS) වෙනුවෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි දිගුකාලීන කැපවීම, සහ සමාජ වගකීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලොව පුරා සිදු කෙරෙන සමාගමේ ක්‍රියාකාරීත්වයන් තුළදී හිමි වේ. අපගේ ක්‍රියාකාරීත්වය තුළ සහ සැපයුම් දාමය තුළ පාරිසරික තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම යනු සරල වශයෙන් කිවහොත් "ඉටු කළ යුතු නිවැරදි දෙය" වන අතර එය ගනුදෙනුකරුවන්ගේ සහ ව්‍යාපාරයේ හවුල්කරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට අත්‍යවශ්‍ය වේ.

තිරසාරත්වය යන්න අර්ථ දැක්වෙනුයේ "වර්තමානයේ අවශ්‍යතා අනාගත පරම්පරාවල හැකියාවන් අඩු නොකර ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම" යන ලෙසිනි. තිරසාරත්වය මඟින් අපේක්ෂා කෙරෙනුයේ ජනගහන වර්ධනය අඛණ්ඩව සිදු වන බවට අවබෝධ කර ගනිමින්, ආර්ථික, සමාජ වගකීම සහ පාරිසරික බලපෑම තුලනය කිරීමය.

### එලවේට් ටෙක්ස්ටයිල්ස් හි සීමා කර ඇති ද්‍රව්‍ය ලැයිස්තු (Restricted Substances List, RSL) ප්‍රතිපත්තිය

සිය ගනුදෙනුකරුවන්හට ආරක්ෂිත හා ගුණාත්මක භාණ්ඩ සැපයීම සඳහා එලවේට් ටෙක්ස්ටයිල්ස් හි අඛණ්ඩ කැපවීම මඟින් ගෝලීය වශයෙන් එහි භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා වන සියළු කෙඳි, රසායනික ද්‍රව්‍ය සහ ලිහිසි ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැඩි මාර්ගෝපදේශ නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය සඳහන් කරයි. "සීමා කළ ද්‍රව්‍ය" යනු විවිධ රටවල්වල වෙළඳ නාම අනුව තිබීම තහනම් කර හෝ සීමා කර ඇති රසායනික සහ වෙනත් ද්‍රව්‍යයන්ය.

RSL ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් ගනුදෙනුකරුවන්ගේ අවදානම් අඩු වන අතර තාක්ෂණික රෙදිපිළි කර්මාන්තයේ ගෝලීය නායකයෙකු ලෙස එලවේට් ටෙක්ස්ටයිල්ස් නිෂ්පාදන ප්‍රවර්ධනය කෙරේ. එලවේට් ටෙක්ස්ටයිල්ස් RSL ය www.elevatetextiles.com හි සොයා ගත හැකිය.

***ඔබේ වගකීම්***

- එලවේට් ටෙක්ස්ටයිල්ස් පාරිසරික ප්‍රතිපත්ති දැනගනීම.
- එලවේට් ටෙක්ස්ටයිල්ස් හට සිය පාරිසරික ප්‍රතිපත්ති වැඩිදියුණු කර ගත හැකි යම් යම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
- කිසියම් වැරදි පාරිසරික වාර්තාකරණයක් හෝ වෙනත් පාරිසරික ගැටළුවක් එලවේට් ටෙක්ස්ටයිල්ස් පාලන අධිකාරියේ අවධානයට යොමු කිරීම.

# එලවේට් ටෙක්ස්ටයිල්ස් හි තොරතුරු සහ දේපලවල අවංකභාවය

*සමාගමේ සම්පත් සහ වත්කම් ආරක්ෂා කිරීම පිළිබඳ නීති*

## රහස්‍ය තොරතුරු

සමාගමේ එදිනෙදා ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා වන වටිනා රහස්‍ය තොරතුරුවල එලවේට් ටෙක්ස්ටයිල්ස් වැදගත් ආයෝජන සිදු කර තිබේ. අප විසින් රහස්‍ය තොරතුරු අනවසර හෙළිදරව් කිරීම්වලින් වළක්වා ගැනීමට කාර්ය පටිපාටි තුළින් එම ආයෝජනයන් ආරක්ෂා කරනු ඇත. එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වනුයේ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි මෙහෙයුම්, ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු, අපගේ ගනුදෙනුකරුවන් සහ අපගේ සැපයුම්කරුවන් හැකි ඉහළම මට්ටමින් රහස්‍යව තබා ගැනෙන බවට තහවුරු කර ගැනීමය. එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් හට, සිය සේවානියුක්තිය තුළ, එලවේට් ටෙක්ස්ටයිල්ස්, එහි ගනුදෙනුකරුවන් හෝ එහි සැපයුම්කරුවන් පිළිබඳ රහස්‍ය තොරතුරු දැන ගැනීමට ලැබුණහොත්, එම

තොරතුරු සම්බන්ධයෙන් ඉතාමත් රහසිගත ආකාරයෙන් කටයුතු කළ යුතුය. එම තොරතුරුවල අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධයෙන් අනුබද්ධ සමාගම් වගකිව යුතුය. රහස්‍ය තොරතුරු යනු එලවේට් ටෙක්ස්ටයිල්ස් සතු සහ ප්‍රසිද්ධියේ නොදන්නා කරුණු වන අතර, ඒට පහත දැක්වෙන කරුණු ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා වේ:

- එලවේට් ටෙක්ස්ටයිලස් ව්‍යාපාර සැලසුම්
- මිලකරණ තොරතුරු
- අනාවැකි
- වෙළඳපල විශ්ලේශන
- පුහුණු පාඩම් මාලා
- තාක්ෂණික අත්පොත්
- විකුණුම් දත්ත
- පාරිභෝගික තොරතුරු
- පිරිස්/ වැටුප් තොරතුරු
- නිෂ්පාදන තොරතුරු
- ප්‍රසම්පාදන තොරතුරු
- සේවා සහ තත්ත්ව කාර්යසාධනය
- නිෂ්පාදන පිරිවිතර සහ ක්‍රියාවලි
- නිෂ්පාදන පිරිවැය සහ ඵලදායිතා තොරතුරු
- පරීක්ෂණ ක්‍රම
- වෙළඳ සහතිකකරණ දත්ත
- පුද්ගලික සෞඛ්‍ය තොරතුරු

එවැනි තොරතුරුවලට රහස්‍ය ලෙසට තබා ගත යුතුවන ප්‍රකාශ කිරීමේ යොමු කිරීම් සහිත එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් හට ලබා දෙන යම් යම් තොරතුරුද අඩංගු වේ. පොදුවේ, මෙම තොරතුරු ලබා ගැනීමට බලයලත් පුද්ගලයින් වෙත හැර වෙනත් කෙනෙකුට ප්‍රකාශ කිරීමේ අවසරය නොමැතිව රහස්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සිදු නොකළ යුතුය.

එලවේට් ටෙක්ස්ටයිල්ස් හට අයත් රහස්‍ය තොරතුරුවලට අමතරව, එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් විසින් ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍යතාව වෙනුවෙන් එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙත ලබා දී ඇති ප්‍රසිද්ධ නොවන ගනුදෙනුකරුවන්ගේ, සැපයුම්කරුවන්ගේ සහ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ව්‍යාපාරික හවුල්කරුවන්ගේ රහස්‍ය තොරතුරු ආරක්ෂා කළ යුතුය. එවැනි තොරතුරුවලට ගනුදෙනුකරුවන්ගේ නිමැවුම් සහ නිෂ්පාදන දත්ත හෝ සැපයුම්කරුවන්ගේ මිලකරණ තොරතුරු ඇතුළත්ය. පොදුවේ ගත් කල, එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් එම තොරතුරුවල රහස්‍යභාවය සුරකින බවත් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රධාන විධායක නිළධාරී-CEO, එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ආයතනික ජ්‍යෙෂ්ඨ උප සභාපති හෝ වෙනත් එලවේට් ටෙක්ස්ටයිල්ස් හි CEO වෙනුවෙන් සෘජුව වාර්තා කරන පුද්ගලයෙකු වෙතින් සේවකයින් විසින් එය ප්‍රකාශ කිරීමේ ලිඛිත අවසරයකින් තොරව බාහිර පාර්ශ්වයන් වෙත හෙළි නොකරන බවටත් මෙම පාර්ශ්වයන්ට එලවේට් ටෙක්ස්ටයිල්ස් සහතික වේ.

කිසියම් සේවකයෙකු මෙම ප්‍රතිපත්තිය උල්ලංඝනය කරනු ලැබුවහොත්, සේවයෙන් පහකිරීමද ඇතුළුව ඒ දක්වා වන විනය ක්‍රියාමාර්ගයකට යටත් වන අතර, එසේම ආරක්ෂණ නීතිවලට අදාල, අනෙකුත් දෑ අතර, එම උල්ලංඝනය කිරීම සඳහා සිවිල් හෝ අපරාධ දණ්ඩනවලටද යටත් විය හැකිය.

## මූල්‍ය වාර්තාකරණයේ සහ වාර්තා තබා ගැනීමේ නිරවද්‍යතාව

එලවේට් ටෙක්ස්ටයිල්ස් ප්‍රතිපත්තිය වනුයේ සමාගම විසින් මහජනතාව වෙත නිකුත් කරන හෝ නියාමන ආයතන වෙත ගොනු කරන වාර්තාවල සහ ලේඛනවල පරිපූර්ණ, සාධාරණ, කාලීන සහ අවබෝධ කර ගත හැකි හෙළිදරව් කිරීමක් සිදු කිරීම වේ. එලවේට් ටෙක්ස්ටයිල්ස් ප්‍රතිපත්තිය බවට පත්ව ඇත්තේ සහ මින් ඉදිරියට පත් වනුයේ එහි පොත්පත්වල සහ වාර්තාවල සියළු ගනුදෙනු නිවැරදිව පිළබිඹු කිරීමය. තවද, එලවේට් ටෙක්ස්ටයිල්ස් ප්‍රතිපත්තිය වනුයේ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි සියළු පොත්පත් සහ වාර්තා සහ බැංකු ගිණුම්වල හෝ අනෙකුත් සුරක්ෂිතාගාරවල ඇති වත්කම් සියළු සාමාන්‍ය ගිණුම්කරණ සහ විගණන පාලනවලට යටත් කිරීම වන අතර, එහි කිසියම් පොත්වල සහ වාර්තාවලින් බොරු විස්තර ලබා දීම හෝ කිසියම් රහස් බැංකු ගිණුම් හෝ සුරක්ෂිතාගාර පවත්වා ගැනීමත් සපුරා තහනම් වේ. වගකිවයුතු ව්‍යාපාරික තීරණ ගැනීමට තොරතුරු අවංක සහ නිවැරදි ලෙස සටහන් කර ගැනීමක් සහ වාර්තා කිරීමක් එලවේට් ටෙක්ස්ටයිල්ස් හට අවශ්‍ය වේ. වාර්තා රඳවා ගැනීම සහ විනාශ කිරීම සිදු කළ යුත්තේ ද එලවේට් ටෙක්ස්ටයිල්ස් හි වාර්තා රඳවා ගැනීමේ ප්‍රතිපත්තිය අනුවය.

## සමාගමේ සම්පත් සහ බුද්ධිමය දේපළ

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි බුද්ධිමය දේපළ වටිනා සම්පතකි. සමාගමේ නම සහ ලාංඡනය මඟින් එලවේට් ටෙක්ස්ටයිල්ස් නියෝජනය කෙරෙන අතර එය අනිසි ලෙස භාවිතා කිරීමෙන් සමාගමේ ජනප්‍රියත්වයට හානි සිදු වීම හෝ ආර්ථික අනිටු ඵල විපාක ඇති වීමට මුල් විය හැකිය. ඒට අමතරව, සමාගමේ නම දරන කිසියම් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රමිති සපුරාලන බවට සමාගම වග බලා ගත යුතුය. ෆෙඩරල් නීතිය සහ වෙනත් විදේශීය නීති යටතේ පේටන්ට් බලපත් සහිත සොයා ගැනීම් සෑදීමට, භාවිතා කිරීමට හෝ විකිණීම සඳහාත් ප්‍රකාශන හිමිකම සහිත භාණ්ඩවල පිටපත් බෙදාහැරීම සඳහාත් පරම අයිතියද එලවේට් ටෙක්ස්ටයිල්ස් සතු වේ. මෙම අයිතීන් බලාත්මක කිරීම එලවේට් ටෙක්ස්ටයිල්ස් භුක්ති විඳින තරඟකාරී වාසි පවත්වා ගැනීම සඳහා වන වැදගත් පියවරකි. ඒට අමතරව, එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් රැකියාව සම්බන්ධයෙන් නිර්මාණය කරන ලද හෝ සමාගමේ සම්පත් යොදා ගෙන නිෂ්පාදනය සියළු සොයාගැනීම් එලවේට් ටෙක්ස්ටයිල්ස් සතුවේ.

සමාගමේ ව්‍යාපාර කටයුතු සිදු කිරීමට, එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් විවිධ විද්‍යුත් පද්ධති සිදු කරන අතර ඒවාට දුරකථනය, සෙලියුලර් දුරකථන, පේජර්, හඬ පණිවිඩ පහසුකම්, එලවේට් ටෙක්ස්ටයිල්ස්-විසින් සපයන ලද පුද්ගල පරිගණක, PDA වර්ග (පුද්ගල ඩිජිටල් සහායක), ලැප්ටොප්, ෆැක්ස් යන්ත්‍ර, මෝඩම්, සහ සේවා සහ එලවේට් ටෙක්ස්ටයිල්ස්-විසින් සපයන ලද ඊමේල් සහ අන්තර්ජාල ප්‍රවේශය වැනි පහත දෑ ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ:. මෙම ප්‍රතිපත්ති භාවිතය තුළ ඇති පරස්පර විරෝධී විධිවිධාන මෙම ගෝලීය චර්යාධර්ම සංග්‍රහය අභිබවා යන පරිදි මෙම පද්ධති භාවිතය ගෝලීය චර්යාධර්ම සංග්‍රහයට හා ඊට අදාළ ඕනෑම උසස් රෙදිපිළි ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. තවද කිසිදු අවස්ථාවක එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් මෙම උපකරණ සාවද්‍ය, විනාශකාරී, හෝ සදාචාර විරෝධී ආකාරයෙන්, හෝ කිසිදු එලවේට් ටෙක්ස්ටයිල්ස් ප්‍රතිපත්තියක් හෝ කාර්ය පටිපාටියක් උල්ලංඝනය වන පරිදි සිදු නොකළ යුතුය.

## රජය සමඟ වන සන්නිවේදනයන්

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රතිපත්තිය වනුයේ රජයේ ආයතන සමඟ එම ආයතනයන්හි නියමිත කාර්යසාධනය තුළ සුහදත්වයෙන් කටයුතු කිරීම වේ, එසේ නමුත් රජයේ පරීක්ෂණවලට පිළිතුරු දීම එලවේට් ටෙක්ස්ටයිල්ස් තුළ සම්බන්ධීකරණය කිරීම අතිශයින් වැදගත්ය. ෆෙඩරල්, ප්‍රාන්ත, ප්‍රාදේශීය හෝ නාගරික රජයේ බලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හෝ විමසීම් ඒවා ලබා ගන්නා පුද්ගලයා විසින් සටහන් කර ගෙන, කිසියම් සුදුසු අදහස්ද සමඟ, එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශය වෙත වහාම යොමු කළ යුතුය. සාමාන්‍ය ආකාරයේ නොවන සෑම ඉල්ලීමක්ම ලැබුණු බව දැන්වීම සඳහා සහ කාලීනව අනුකූල වීම පිණිස නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන වගකීම එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශය සතු වේ.

## මහජනතාව සමඟ අදහස් හුවමාරු කර ගැනීම

එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ප්‍රධාන විධායක නිළධාරී-CEO විසින් නියම කර ඇති පුද්ගලයන්ට පමණක් ප්‍රවෘත්ති මාධ්‍ය, විශ්ලේෂකයින් හෝ සාමාන්‍ය මහජනතාව වෙත එලවේට් ටෙක්ස්ටයිල්ස් වෙනුවෙන් කතා කිරීමේ බලය ලබා දී තිබේ. මහජනතාව සමඟ එලවේට් ටෙක්ස්ටයිල්ස් හි අවංකභාවය පවත්වා ගන්නා බවට සහතික වනු පිණිස පැහැදිලි සහ නිවැරදි සන්නිවේදනයන් ප්‍රවෘත්ති මාධ්‍ය සහ මහජනතාව වෙත සැපයීමට එලවේට් ටෙක්ස්ටයිල්ස් සෑම ප්‍රයත්නයක්ම දරයි. ප්‍රවෘත්ති මාධ්‍ය, විශ්ලේෂකයින්, හෝ ප්‍රශ්න අසන වෙනත් පුද්ගලයින් මඟින් අමතනු ලැබුවහොත්, පිළිතුරු ලබා දීම පිණිස සියළු එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් එම තැනැත්තන් ප්‍රධාන මානව සම්පත් නිළධාරී වෙත යොමු කළ යුතුය.

# ශක්තිමත් බැඳීමක්

*ගුණාත්මකභාවය, සේවය, වටිනාකම සහ අවංකත්වය. එහි වෙනසක් තිබේ.*

සදාචාරාත්මක ආකාරයට කටයුතු කිරීම සඳහා වන වගකීම සතු වන අතර තම ක්‍රියාවන් සඳහා වගකීම භාර ගැනීම එලවේට් ටෙක්ස්ටයිල්ස් තුළ සිටින සියළු දෙනා විසින් සිදු කළ යුතුය. අපගේ වටිනාකම් සහ ප්‍රතිපත්ති විෂය පථය ගෝලීය වන අතර මෙම වටිනාකම් සහ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් වටහා ගෙන යොදා ගැනීම සඳහා අප සියළු දෙනා කාලය යොදා ගත යුතුය. මෙමගින් අප සියළු දෙනා වෙත ලබා දෙන අභියෝගය එලවේට් ටෙක්ස්ටයිල්ස් වටහා ගනී, එසේ වුවද අපගේ සමාගමේ සාර්ථකත්වය රඳා පවතිනුයේ, අප එකිනෙකා සමඟ පවත්වන සම්බන්ධතා තුළ සහ ප්‍රජාව තුළ අප පවත්වන සම්බන්ධතා තුළින් වෙළඳපල තුළ වන අපගේ අවංකභාවය මතය.

සිය චර්යාධර්ම සංග්‍රහය සහ අනෙකුත් ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවලට අමතරව මෙම ගෝලීය චර්යාධර්ම සංග්‍රහය හා අනුකූල වන්නේදැයි එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් උනන්දුවෙන් හා අඛණ්ඩව විමර්ශනය කරනු ඇත. මීට ආචාරධර්ම කමිටුව සුදුසු යැයි සලකන පරිදි ලොව වටා සිටින එලවේට් ටෙක්ස්ටයිල්ස් සේවකයින් සඳහා අනුකූලතා පුහුණුව ලබා දීම ඇතුළත්ය. තවද, එලවේට් ටෙක්ස්ටයිල්ස් විසින් නියාමන හෝ එක්සත් ජනපද ආරක්ෂණ නීතිවල අනුකූලතා ඇඟවීම් සහිත සිය ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවල අනුකූලතාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විගණනයන් පවත්වනු ඇත.

# සේවකයාගේ තහවුරු කිරීම

කරුණාකර ඔබේ මානව සම්පත් කළමනාකරු හෝ ඔබ සේවය කරන ස්ථානයේ සාමාන්‍යාධිකාරීවරයා වෙත මෙම කොටස භාර දෙන්න (ඔබේ සේවක රැකියා ගොනුවේ තබා ගැනීම සඳහා).

මට එලවේට් ටෙක්ස්ටයිල්ස් හි ගෝලීය චර්යාධර්ම සංග්‍රහයේ පිටපතක් ලැබුණි. එහි විස්තර කර ඇති මගේ රැකියාව හා අදාළ පැවතුම්හි ප්‍රමිති මට වැටහෙන අතර ඒවාට අනුකූල වීමට මම එකඟ වෙමි.

අත්සන ________________________________________

නම මුද්‍රනය කරන්න ________________________________________

දිනය ________________________________________

අංශය ________________________________________

ස්ථානය ________________________________________

ගෝලීය චර්යාධර්ම සංග්‍රහය පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් ඇත්නම් එලවේට් ටෙක්ස්ටයිල්ස් ආයතනික නීති අංශය (compliance@elevatetextiles.com) හෝ සාමාන්‍ය නීති උපදේශන කමිටුව හා ප්‍රධාන අනුකූලතා නිලධාරී (Kristen.hughes@elevatetextiles.com; +1-704-951-2655) වෙතට යොමු කළ යුතුය.



A&E Innovate. Create. Deliver. Burlington CONE DENIM Gütermann SAFETY COMPONENTS

(මෙම පිටුව හිතාමතාව හිස් ලෙස තබා තිබේ)

ET0919